# ඒ වසන්තයමයි සමඟ එන පුෂ්පා තිසේරා

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ



**මැයි** මාසෙ 4 ඉරිදා කෙල්වොට්සන් රඟහලේදී සවස 5 ට ඒ වසන්තයමයි සංගත තැටිය දොරට වඩිනවා. අවුරුදු ගණනාවක් සංගීත ක්ෂෙත්‍රයේ රැඳී සිටිමින් තමන්ගේ කුළුඳුල් නිර්මාණය එළි දක්වන මොහොතේ පුෂ්පා තිසේරා සමගින් ඒ පිළිබඳව කතිකාවක් කරන්නට අපි හිතුවා.

*ශ්‍රීනාත්*
මේ සංගත තැටිය නිර්මාණය වුණේ කොහොමද? ඇයි මේකට ඒ වසන්තයමයි කියන නම යෙදුවේ?

*පුෂ්පා*
සංගත තැටියක් දොරට වැඩීම මගේ හිතේ අවුරුදු ගාණක් ඉඳලා තිබුණ සිහිනයක්. හැම විටම මේ සිහිනය ඉටු කර ගන්න මගේ වටේ හිටිය හිතාදර මිත්‍රයන් පවුලේ අය මාව දිරිමත් කළා. මෙයට ඒ වසන්තයමයි කියන නම යෙදුවේ මේ සංගත තැටියේ අඩංගු වන එක් ගීතයක් නිසයි. ඒ එක්කම ඔස්ට්‍රේලියාවේ ජීවත් වන අපට වසන්ත කාලය ඉතාමත් චමත්කාරයි. ශ්‍රී ලංකාවට වුණත් එහෙමයි. ඉතින් ඒ නිසා මං ඒ නමට කැමති වුණා.

*ශ්‍රීනාත්*
මේ සංගත තැටිය නිෂ්පාදනය කළේ ලංකාවෙදිද?

*පුෂ්පා*
නෑ. මෙහි පටිගත කිරීම් සියල්ලම වගේ සිදුවුණේ කළිඳු වීරසිංහගේ මග පෙන්වීම යටතේ ඔස්ට්‍රේලියාවේ ශබ්දාගාරයකදියි. ඊට අමතරව මා සමග යුග ගීත ගායනා කරන ශ්‍රී ලංකාවේ ප්‍රවීණ ශිල්පීන් තම තමන්ගේ කොටස් ශ්‍රී ලංකාවේදී පටිගත කළා.

*ශ්‍රීනාත්*
කව්ද මේ සංගත තැටියට ඔබ සමග යුග ගී ගායනා කරන්නෙ?

*පුෂ්පා*
සුනිල් එදිරිසිංහ, කීර්ති පැස්කුවල්, ක්‍රිෂාන්ත එරන්දක, ලෙස්ලි තෝමස් යන අය යුග ගායනයෙන් සහභාගි වෙනවා. ඊට අමතරව මෙහි ගීත වලට සංගීතය රෝහණ වීරසිංහ, කැමරන් කොළඹගේ, කළිඳු වීරසිංහ, සුරේෂ් මාලියද්ද, මහින්ද බණ්ඩාර, ක්‍රිස්ටි අමරනාත් යන ශීල්පීන් විසින් නිර්මාණය කරනු ලැබුවා. ගීත රචනයෙන් කුමාරදාස සපුතන්ත්‍රී බන්දුල, නානායක්කාරවසම්, අජන්තා රණසිංහ, ජගත් ජේ එදිරිසිංහ, රවි සිරිවර්ධන, සිසිර දිසානායක, වරුණ සාවින්ද, බ්‍රයන් ජෙගනාදන්, සුසන්ත අබේසිංහ යන අය මට සහය වුණා. මෙහි සියලුම කටයුතු වලදී මට සියලු මග පෙන්වීම කළ කළිඳුත්, රවි සිරිවර්ධනත්, කැමරන් කොළඹගේත් මතක් කරන්න කැමතියි.

*ශ්‍රීනාත්*
මේ ප්‍රසංගයට සංගීතයෙන් හා ගායනයෙන් ඔබට උදව් වන අය කව්ද?

*පුෂ්පා*
මේ ප්‍රසංගයට කැමරන් කොළඹගේ ප්‍රමුඛ තරංගා වාදක මණ්ඩලයත් ගීත ගායනයෙන් රෝහණ කරුණාරත්න, රොෂාන් ප්‍රනාන්දු, හේමන්ත ඩයස්, ජානක විජේසේකර යන අය සහය වනවා.

*ශ්‍රීනාත්*
ඔබේ සංගීත දිවිය ආරම්භ වෙන්නේ කොහොමද?

*පුෂ්පා*
ඇත්තටම මම සංගීතය මුල සිටම හදාරපු කෙනෙක් නෙවෙයි. නමුත් පල්ලියේ ගීතිකා කණ්ඩායමේ කුඩා කල සිටම හිටියා. ඒ වගේම ගීතිකා ඉතා විශාල ප්‍රමාණයක් නිර්මාණය කළ ජේ කේ එස් පෙරේරා මගේ මාමා. ඔහුගේ උදව් අපකාරත් මට ලැබුණා. ඒ එක්කම මං ඉගෙන ගත්ත හලාවත ශාන්ත මරියා කන්‍යාරාමයෙනුත් පිටුවහලක් ලැබුණා. මං පාසලේදී පියානෝ වාදනය ඉගෙන ගත්තා.

*ශ්‍රීනාත්*
ඔබ ශ්‍රී ලංකාවේදී රැකියාව හැටියට කළේ මොකක්ද?

*පුෂ්පා*
මම විද්‍යා ගුරුවරියක හැටියට සේවය කළා. ඔස්ට්‍රේලියාවට එනවිට මම මීගමුව දළුපොත කන්‍යාරාමයේ ගුරුවරියක ලෙස සේවය කරමින් සිටියා.

*ශ්‍රීනාත්*
ඔස්ට්‍රේලියාවට ආවේ මොන අවුරුද්දෙද?

*පුෂ්පා*
1994 දී..

*ශ්‍රීනාත්*
ඔබ පළමු වරට සහභාගිවූ ප්‍රසංගය කුමක් ද?

*පුෂ්පා*
මම මුලින්ම ගීතයක් ගායනා කළේ 1995 ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමයේ සුහද හමුවකදීයි. ඊට අමතරව කැරොල් ගායනා වලටත් සහභාගි වුණා. ප්‍රසිද්ධ වේදිකාවට ආවේ 2000 ගිම්හාන රංගන ප්‍රසංග යෙන්. ඊට පස්සේ සුපර් සහරා සංගීත කණ්ඩායමේ නිත්‍ය ගායිකාව ලෙස කටයුතු කළා.

*ශ්‍රීනාත්*
ඔබ මෙහි පැමිණෙන ගායක ගායිකාවන්ගේ ප්‍රසංග වල අත්වැල් ගායනයට සහභාගි වෙනවා නේද?

*පුෂ්පා*
බොහෝ වෙලාවට මම සහභාගි වෙනවා. මට ඒ අවස්ථාව ලැබුණේ සහරා සංගීත කණ්ඩායමත කැමරන් කොළඹගෙ මහතාගේ තරංගා සංගීත කණ්ඩායමත් නිසා. 2004 පැවැත්වුණ රන් ස්වර ධාරා ප්‍රසංගයට මම අත්වැල් ගායනා කළා. එහිදී ප්‍රවීණ ගායකයන් විශාල ප්‍රමාණයකට අත්වැල් ගායනා කරන්න මට හැකි වුණා. ඒ අවස්ථාව ලබා දුන් කැමරන කොළඹගේ මහගා ආදරයෙන් ගෞරවයෙන් මතක් කරනවා.

*ශ්‍රීනාත්*
ඔබේ සංගීත දිවියට පවුලෙන් ලැබෙන සහය කොහොමද?

*පුෂ්පා*
මගේ මහත්තයා සුලාල් ප්‍රනාන්දු හැම විටම මගේ සංගීත දිවියට උදව් කරනවා. මට වඩා මං ගැන උනන්දු වෙනවා. ඒ එක්කම සුපුන් සහ රමේෂ් යන මගේ දරුවන් දෙදෙනාත් මා අවට සිටින සියලුම යහළු යෙහෙළියනුත් මට උදව් කරනවා. මං මුලින් කිව්වා වගේ මගේ සංගත තැටියටත් මූලික වුණේ මේ සියලු දෙනා. ඒ අයට ස්තුති කරන්න මං මේ අවස්ථාව කර ගන්නවා.

අපි පුෂ්පා ගේ 'ඒ වසන්තය ම යි' සංගීත ප්‍රසංගය සර්වප්‍රකාරයෙන්ම සාර්ථ ක වේවායි පතනවා. නොවරදවා මැයි 4 වන දා සවස 5ට කෙල් වොට්සන් ශාලාවට එන්නැයි සන්නස කියවන ඔබෙනුත් ඉල්ලා සිටිනවා.





රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු

Voice of Lanka
97.7FM 3SER

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243